# 2018 ඔක්තෝබර් මස සාංඝික පවුල් දින සුපුවත
# 'ආත්මයාණන් වහන්සේගේ මෙහෙයවීමට ඉඩ දෙන තැනැත්තා සැබවින්ම ආශිර්වාද ලද්දෙකි.'

01.ආරම්භක ප්‍රශංසාව:

පුබුදු ගී අංක 02 "නමෝ නමෝ ශුද්ධාත්මයාණෙනි....."

02. ප්‍රශංසාවට යොමුව : එපීස 5:18-20 රෝම 8:26

**" මුද්‍රික පානයෙන් මත් නොවන්න. එයින් අනාචාරකම් හට ගන්නේය. ඒ වෙනුවට ආත්මයාණන්ගෙන් පූර්ණ වන්න. ගීතිකා, තුති ගී හා ශුද්ධ ගී එකිනෙකාට ගයන්න. ඔබ හදවත් තුළ තුති ගී නද දෙමින් සමිඳුන්ට ගී ගයන්න. අපගේ සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන්, දෙවි පියාණන් වහන්සේට සැම විට සැම දේ ගැනම, ස්තුති කරන්න."**

ආත්මයාණන්ගෙන් පූර්ණව යාච්ඤා කරන්නට පුබුදු ජනතාව ලබා ඇති ආශිර්වාදය අති මහත්ය. ආත්මයාණන් වහන්සේට ඉඩ දෙමින් යාච්ඤා කරන්නා දෙවියන් වහන්සේ හා ගැඹුරු සම්බන්ධතාවයක් පවත්වන්නෙකි. ඔහු දෙවියන් වහන්සේගේ හඬට සවන් දෙමින්, තමාව අමතක කොට ගැඹුරු නිදහසකින් ප්‍රශංසාවේ යෙදෙයි. ගීතිකා, තුති ගී, ශුද්ධ ගී ඔවුන්ගේ මුවින් නික්මෙයි. ප්‍රශංසාවේ ගීතිකා, දෙවියන් වහන්සේට තමා ලත් අත්දැකීම් මුල් කරගෙන තුති ගී ද ආත්මයාණන් තුළ ශුද්ධ ගී ද ගයමින් ප්‍රශංසාවේ යෙදෙයි. අන්‍ය භාෂාවෙන් ද ගීතමය ප්‍රශංසාවෙන් ද දෙවිඳාණන් පසසයි. අන්‍ය භාෂාවෙන් ප්‍රශංසා කරන්නා පූර්ණව ආත්මයාණන් වහන්සේට තමන්ව මෙහෙයවන්නට ඉඩ දෙන කෙනෙකි. ඔහු ප්‍රකාශ කරන වචන, මුමුණන හඬ පිළිබඳව ඔහු තුළ කිසිදු අවබෝධයක් හෝ දැනගැන්මක් නැත. එමනිසා ඔහු කරන යාච්ඤාව ශුද්ධාත්මයාණන් වහන්සේම ඔහු හෝ ඇය තුළ සිටිමින් කරන යාච්ඤාවකි. අන්‍ය භාෂාවෙන් යාච්ඤා කරන්නා තමන් අන්‍ය භාෂාවෙන් ප්‍රකාශ කරන වචනය පිළිබඳ පැහැදිලි කිරීම තමන් විසින්ම ඉදිරිපත් කිරීමේදී පරිස්සම් විය යුතුයි. එයට හේතුව තමා කරන යාච්ඤාව පිළිබඳ කිසිවක් තමා නොදන්නා බැවිනි. එම යාච්ඤාව ශුද්ධාත්මයාණන් වහන්සේම කරන යාච්ඤාවක් බැවිනි. ශු.පාවුළු තුමා කොරින්ති වරුන්ට ලියන ලද ලිපියේ සඳහන් කරන පරිදි අප එකිනෙකා විවිධාකාර දීමනා ලබා ඇත. අන් භාෂාවලින් යාච්ඤා කිරීමේ දීමනාව කෙනෙකු ලබා ඇති අතර, තවත් කෙනෙකු වචනය පහදා දීමේ දීමනාව ලබා ඇත. (1කොරොන්ති 12:4-11) එමනිසා පිබිදුනු කිතුනුවන් ලෙස සැම විට සැම තැන සැම දේ ගැනම දෙවියන් වහ්නසේට ප්‍රශංසා කරන්නට අප ලබා ඇති විශේෂිත වරමට අවදි වෙමින් ආත්මයාණන් වහ්නසේට ඉඩ දෙමින් අද දවසේ ප්‍රශංසාවට ඇතුල් වෙමු.

පුබුදු ගී 129 "පූර්ණයාණෙනි....."

03. ආපසු බැලීම :

1. පසුගිය මාසය තුළ අප දේශය වෙනුවෙන් සමිඳාණන් වහ්නසේ ඉදිරිපිට සැබෑ මැදිහත්කරුවෙක් වෙමින් යදින්නට ලැබුනු කැඳවීමට ඔබේ ප්‍රතිචාරය කෙසේ විදැයි බෙදා ගන්න.
2. අද දවස තුළ ආත්මයාණන් වහන්සේට ඉඩ දෙමින් ප්‍රශංසාවේ යෙදුනු ඔබ ලැබූ අත්දැකීම බෙදා ගන්න.

04 දවසේ සුපුවත:

**'ආත්මයාණන් වහන්සේගේ මෙහෙයවීමට ඉඩ දෙන තැනැත්තා සැබවින්ම ආශිර්වාද ලද්දෙකි.'**

* දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ලබන්නට නම් ආත්මයාණන් වහන්සේ තුළ ජීවත් වීම දේව හඬට සවන් දීම, දේව වචනය තුළ ජීවත් වීම, දේව කැමැත්තට මුළුමනින් අවනත වීම අතී අවශ්‍යයය.

* පුබුදු ජනතාවක් ලෙස මේ වසරේ අප ලද තේමාව ඊට සාක්ෂි දරන්නට මහඟු රුකුලකි. "ඔබ වහන්සේගේ වචනය ද කැමැත්ත ද ගින්නකි; ආශිර්වාදයකි"

* ආත්මයාණන් වහන්සේට තමා තුළ ක්‍රියා කරන්නට, තමාව මෙහෙයවන්නට පූර්ණව ඉඩ දුන් භාග්‍යවන්ත මාතාවන් සමරණ මෙම මාසය තුළ අප සැමද ඕතුමිය ලද ආශිර්වාදය ගැන මෙනෙහි කරමින් අපගේ ජීවිත තුළ අප ලබා ඇති කැඳවීමට අවදි වෙමු.

* භාග්‍යවන්ත අම්මාගේ මුළු ජීවිතයම ශුද්ධාත්මයාණන් වහන්සේ විසින්ම මෙහෙයවන ලද ජීවිතයක් බව එතුමියගේ ජීවිතය පිළිබඳ මෙනෙහි කරන අපට වටහා ගත හැකිය.

i ජම්ම දෝෂයෙන් නිර්දෝෂව මෙලොවට බිහිවීමම ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වයක් නොවේද? භාග්‍යවන්ත මාතාවන් ජම්ම පාපයෙන් නිර්දෝෂව පිළිසිඳුනු කන්‍යාවක් බව විශ්වාස කළයුතු සත්‍යතාවයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමෙන් සාන්ත සභා මාතාව එය අපට උගන්වන්නීය. (ix වන පියුස් පාප් තුමා විසින් 1854/12/08 වන දින වර්ණනා විෂයාධිකාන්ත දෙව් මහෝත්තමයාණෝ යන වේද සත්‍ය ව්‍යවස්ථාව මගින් මරියතුමියගේ නිර්මල පිළිසිඳීම වේද සත්‍යයක් ලෙස නිර්වචනය කර ප්‍රකාශයට පත් කරන ලදී )

ii ශු.ලූක් 1:26-38 භාග්‍යවන්ත මාතාවන්ට ගාබ්‍රියෙල් දේව දූතයා මංගලම් කී මොහොත. විශ්වයේ ගැළවීම සඳහා දෙවියන් වහන්සේගේ සැලසුම ආත්මයාණන් වහන්සේ විසින්ම ක්‍රියාවට නංවන මොහොතක් නොවේද?
නොසිතූ මොහොතක, නොපැතූ ආචාරයක්, ආරාධනාවක් එතුමියගේ සවන් ගත වූ මොහොතේ දැනුනු හැඟීම, අත්දැකීම විස්තර කළ නොහැකි තත්ත්වයක් වුවද ඇසුනු හඬ, හඬ තුළින් පැමිණි දෙවියන් වහන්සේගේ වචනය තම ආත්මය තුළට ලබා ගන්නට එතුමියව මෙහෙයවූයේ ශුද්ධාත්මියාණන් වහන්සේමය.

- තම ජීවිතයේ සියල්ල හිස් කරන්නට දේව කැමැත්ත තමා තුළ ඉටු වෙන්නට ඉඩ හරින්නට ආත්මයාණන් වහන්සේට නතු වුනු දෙව් මවුන් "මේ මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි"යි පැවසුවේ පූර්ණව ආත්මයාණන් වහන්සේට ඉඩදීමේ ප්‍රතිඵලයක් ලෙසය.

iii එලිසබෙත් තුමිය බැහැදකින්නට යාම (ශු.ලූක් 1:39-45)
සාමාන්‍ය මනුෂ්‍ය මවකට තමා සිටින අත්දැකීමේ සිට කළ නොහැකි ක්‍රියාවක් වන කඳුකරයට යුහුව යාම, එලිසබෙත් තුමිය හට සංවේදී වීම, එතුමිය සිටින අත්දැකීමට එකමුතු වීම, ආත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරිත්වයට ඉඩදීමේ ප්‍රතිඵලයක් ලෙස අපට දැකිය හැක. මෙම සිදුවීම තුළ එලිසබෙත් තුමිය දේව අම්මාට කරන ලද ආචාරය, දේව අම්මා එලිසබෙත් තුමියට කරන ලද ආචාරය තුළ සිදුවූයේද ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වයයි. "එලිසබෙත් මරියතුමීගේ ආචාර බස් ඇසූ කල ඇගේ කුසෙහි දරුවා ඉපිලෙන්නට විය එලිසබෙත් ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව මහා හඬින් උදම් අනමින් ඔබ වනිතාවන් අතර අතිශයින් ආශිර්වාද ලද්දීය. ඔබ කුස හොත් දරු ඵලයද ආශිර්වාද ලද්දීය."

iv කානාහි සරණ මංගල්‍යය (ශු.ජොහාන් 2:1-5)
මෙම සිදුවීම තුළද ශුද්ධාත්මයාණන් වහ්නසේගේ මෙහෙයවීමට ඉඩ දුන් භාග්‍යවන්ත අම්මාගේ ජීවිතය ඉතාම පැහැදිලි ලෙස අපට පෙනෙනු ඇත. මොහොතේ ජීවිතය අනෙකාගේ අවශ්‍යතාවයට සංවේදී වීම, මොහොතට එකමුතු වීම, සොයා බැලීම, අවදි වීම සාංඝික ජීවිතය වැනි උතුම් ගුණාංග පිළිබිඹු වේ. එපමණක්ද නොව දෙවියන් වහන්සේ කෙරෙහි තිබූ ස්ථිර විශ්වාසය, බලාපොරොත්තුව ප්‍රකාශ වනුයේ මිදි යුෂ නැතැයි ජේසු සමිඳාණන්ට පැවසූ මොහොතේ ඔවුන් වහන්සේගේ පිළිතුරෙන් ද ('ස්ත්‍රිය ඔබත් මමත් මේ ගැන කරදර වන්නේ කුමකටද? මාගේ මොහොත තවම පැමිණ නැත') නොසැලී ආත්මයාණන් වහන්සේට ඉඩ දුන් ඕතුමිය "මෙතුමාණන් ඔබට කියන කොයි දෙයක් වුවද කරන්න" යැයි පවසන්නේද පූර්ණ විශ්වාසයෙන් යුතුවය. පැමිණ නැති පැය පැමිණෙන්නට භාග්‍යවන්ත අම්මා දුන් දායකත්වය සැබවින්ම ශුද්ධාත්ම මෙහෙයවීමට පූර්ණව ඉඩදීමේ ප්‍රතිඵලයකි.

05. කුරුස පාමුල (ශු.ජොහාන් 19:28-30)
තම පුතු කුරුසේ එල්ලී සිටිනු දකිමින් පියාණන් වහන්සේ සිදු කරන්නට යන පුදුම දෙය දෙස බලා සිටින්නට නම් මිනිස් දුවකට නොහැකිය. උත්ථානය විශ්වාසයෙන් දකිමින් තම දෑස දෙවියන් වහන්සේ වෙතට ඔසවා සිටින්නට භාග්‍යවත් අම්මාට හැකිවූයේ ආත්මයාණන් වහන්සේගේ පූර්ණ මෙහෙයවීමට ඉඩදීම තුළිනි. විශ්වාසය, බලාපොරොත්තුව, ප්‍රේමය තම හද තුළ නිදන් කරගත් දේව අම්මා සහය ගැළවුම්කාරිය වූවාය, විශ්වයේ මාතාව වූවාය, ශුද්ධවූ සභාවේ මාතාව ද වූවාය. මෙවැනි ගෞරවයක් ලබන්නට එතුමියගේ ජීවිතය ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරුණු, දේව වචනය තම ජීවිතයෙන් ප්‍රකාශ වුනු, දේව කැමැත්ත පමණක්ම ඉටු කළ ආශිර්වාදිත ජීවිතයක්ම විය. සේනාකුළු ශාලාවේ ශ්‍රාවක සංඝය සමග ගැඹුරු බලාපොරොත්තුවකින් පසුවූයේද ආත්මයාණන් වහන්සේ තුළ ජීවත් වන ජීවිත ගොඩ නගන්නට තමන් හට ලැබුනු කැඳවීමට අවදි වෙමිනි.

* භාග්‍යවන්ත අම්මාගේ මුළු ජීවිතයම ශුද්ධාත්ම මෙහෙයවීමට නතු වූ දේව වචනයට පූර්ණව කැපවූ දේව කැමැත්ත ඉටු කිරීමේ පිපාසයෙන් හා අවදි වීමෙන් ගත කළ දිවි පැවතුමෙන් පූජක, රාජකීය, දිවැසිවර කැඳවීමට සාක්ෂි දැරූ ජීවිතයක් විය.

* භාග්‍යවන්ත අම්මාගේ හදවත තක්ෂිලාවකි. "ක්‍රිස්තුන් වහන්සේ ගැන අභිරහස් දැනගැන්මට, ඉගෙන ගැනීමට ඇති විදුහල මරියෝත්තමයාණන්ගේ හදවතයි. දේව අම්මාගේ හදවත තුළින් ජේසු සමිඳුන් හා ජීවමාන සම්බන්ධතාවයක් ගොඩනගා ගත හැකිය.

06. සාකච්ඡාව සඳහා : (හතර දෙනාගේ කුඩා සංඝය තුළ)

i භාග්‍යවන්ත මාතාවන් සමරණ මෙම මාසය පිබිදුනු කිතුනුවන් වන ඔබට / මට හුදෙක් සිහිකිරීමක්, සැමරීමක් පමණක්ම ද? නුවාන / ප්‍රතිමාවන්ට මල්මාල දැමීම, භක්ති අභ්‍යාසවල යෙදීමෙන් පමණක් අපට සෑහීමට පත්විය හැකිද?

ii පුබුදු අපේ කැරිස්මාවේ පළමු අත්දැකීම භාග්‍යවන්ත අම්මා මෙන් වන්නට අපට ඇරයුම් කරයි. ඕතුමිය තුළ වූ සුවිශේෂී ජීවිත ගුණාංගයන් අපගේ කරගන්නට අප තුළ ඇති අවදිවීම කොතෙක්ද?
- නිශ්චලතාවය
- හිස්වීම
- අත්හැරීම
- ඉඩදීම
- විවෘතවීම

එදිනෙදා ජීවිතයේ අප අත්දකිනවාද?

iii පෞද්ගලික ජීවිතය තුළ, පවුල තුළ, සංඝය තුළ, රට තුළ අප මුහුණ දෙන විවිධ සිදුවීම් වලදී ශුද්ධාත්මයාණන් වහන්සේට අපව මෙහෙයවන්නට අප කොතෙක් ඉඩ දෙනවාද?

iv දේව වචනය, දේව හඬ ඇසි ඇසිත්, නෑසෙනවා සේ සිටින අපට භාග්‍යවන්ත අම්මාගේ ජීවිතය අභියෝගයක් නොවේද? හැම මොහොතකම අවදියෙන් සිටින්නට විශ්වාසයෙන් පියවර ගන්නට, බලාපොරොත්තුවෙන් ජීවත් වන්නට අප තුළ ඇති පිපාසය කොතෙක්ද?

07. ප්‍රායෝගිකව :

* පුබුදු ජනතාවක් ලෙස නිරන්තර අවදිවීමට අප ලබා ඇති අත්දැකීම නැවත නැවත අළුත් කර ගනිමු. දිනකට 7 වතාවක් අවදි වන්නට, පස් වැදෑරුම් ශුද්ධාත්ම මෙහෙයවීමට ඉඩ දෙන්නට අපි අවදි වෙමු.
* ගැඹුරු ඉඩදීමේ ජීවිතයක් ගත කරන්නා තුළින් ප්‍රකාශ වෙන සාක්ෂි දැරීමට අපි ඇතුළු වෙමු.
* දේව වචනය කියවන්නට, මෙනෙහි කරන්නට වෙලාවක් සොයා ගනිමු.
* අප ලබන අත්දැකීම් එකිනෙකා සමඟ බෙදා ගනිමු.

08. අවසාන ප්‍රශංසාව :

පුබුදු ගී අංක 229 "හදවත මාගේ...."

*******************

අවධානය සඳහා :

1. * පුබුදු ජාතික පවුල් දිනය ඔක්තෝම්බර් මස 14 වන ඉරුදින පෙ.ව. 09.00 - ප.ව.04.00 දක්වා ශ්‍රී ප්‍රශංසාරාමයේදී පැවැත්වේ.
   * සෑම පවුලක්ම අමතර කෑම පාර්සලයක් රැගෙන එන්න. (දුරස්ථරයෙන් පැමිණෙන පවුල් සඳහා)
   * දිව්‍ය පූජාව සමඟ පොරොන්දු අළුත් කිරීම සිදුවන බැවින්, මංගල මුදු රැගෙන එන්න.

2. ඔක්තෝම්බර් මස 20 වන සෙනසුරාදා පෙ.ව.09.30-ප.ව.04.00 දක්වා ශ්‍රී ප්‍රශංසාරාමයේදී පැවැත්වේ.

- ස්තූතියි -